ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# ප්‍රසිද්ධ නිවේදනය

## පසුගිය මාර්තු 5 වන දින සහ ඒ ආසන්න දිනවල මහනුවර නගරය ආශ්‍රිත ප්‍රදේශවල වෛරය සහ ආගමික බෙදුම්වාදය මත ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ පරීක්ෂණය සඳහා මහජනතාව වෙතින් තොරතුරු සහ සාක්ෂි ලිඛිතව රැස්කිරීම

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාරව උක්ත කරුණු පිළිබඳව එම ප්‍රදේශවලටම ගොස් මහජන පැමිණිලි පරීක්ෂා කිරීම මගින්, පරීක්ෂණයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිදු කරනු ලැබේ.

එහි මූලික අදියර ලෙස, මෙම සිද්ධීන් හේතුවෙන් හානියට පත්වූ හා මේ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව වෙතින් තොරතුරු සහ සාක්ෂි ලිඛිතව රැස්කිරීමක් සිදුකරන අතර, එම කරුණු දැක්වීමේදී, ඉදිරිපත් කිරීම පිටු 03 නොවැඩි විය යුතුය අතර, කරුණු දැක්වීමට අදාළ දිනය, ස්ථානය, වේලාව, හඳුනාගත් පුද්ගල නාම සහ ආයතන නාම සඳහන් කළ යුතු අතර, ඡායාරූප, වීඩියෝ පට හෝ හඬ පටි ද ඒ සමග ඉදිරිපත් කළ හැකිය.

මෙම ලිඛිත කරුණු ඉදිරිපත් කිරීම 2018 අප්‍රේල් මස 21 වන දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමුකරන්න;

**ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරිණී**<br>
**මහනුවර ප්‍රාදේශීය කාර්යාලය**<br>
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**<br>
**අංක 8/1, ප්‍රිම්රෝස් පාර**<br>
**පේරාදෙණිය පාර**<br>
**මහනුවර**

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු දූරකථන අංක: 081 2228009 හෝ 070 365 49 01 අමතා මහනුවර ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරිණී වෙතින් ලබාගත හැකිය.

Dr. N. D. Udagama<br>
Chairperson<br>
Human Rights Commission of Sri Lanka

Udagama

සභාපතිනි<br>
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව<br>
2018 අප්‍රේල් 06